

# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය



## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම - 2023

### පශු සම්පත් නිෂ්පාදනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
### Higher Diploma in Livestock Production (HDLP)

**පාඨමාලා කාලය :** වසර 02කි. (පූර්ණ කාලීන)

**පාඨමාලා ගාස්තු :** රු. 120,000,00 (වාරික 3න් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 60,000.00)

**පාඨමාලා මාධ්‍යය :** ඉංග්‍රීසි/ සිංහල

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් එකවර විෂයයන් 3ක් සමත් වීම **හෝ** SLQF මට්ටම 3 / NVQ මට්ටම 5 ට සමාන ක්ෂෙත්‍රයට අදාළ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

- පාඨමාලාව විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විසින් භෞතික හා මාර්ගගත ක්‍රම මගින් පවත්වන දේශන හා සබරගමුව විශ්වවිද්‍යාලයීය, රජයේ හා පෞද්ගලික අංශයේ ගොවිපොළවල පවත්වන ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් සමන්විත වේ.
- නවසීලන්තය, ඕස්ට්‍රේලියාව ඇතුලු රටවල පශු සම්පත් ක්ෂෙත්‍රයේ රැකියා ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ගත හැකි ය.

### ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව - සති අන්ත
### Diploma in English (DE) – Weekends

**පාඨමාලා කාලය :** වසර 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු** : රු 23,000 (වාරික 02 කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු 15,000)

**දේශන පැවැත්වීම -** මාර්ග ගත ක්‍රමය/ පැමිණ සහභාගීවීම

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි විෂය සඳහා “A” හෝ “B” සාමර්ථ්‍යයක් ලබා තිබීම හෝ ඉංග්‍රීසි සාහිත්‍යය විෂය සඳහා “C” සාමර්ථ්‍යයක් **හෝ** ඊට වැඩි සාමර්ථ්‍යයක් ලබා තිබීම **හෝ** අ.පො.ස. (උ.පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා “S” සාමර්ථ්‍යයක් ලබා තිබීම **හෝ** අප ඒකකය මඟින් පවත්වනු ලබන ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සමත් වී තිබීම.

(මෙම පාඨමාලාව සාර්ථක ව නිමකරන සිසුන්හට ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව හැදෑරීමට අවස්ථාව ඇත.)

### ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව - සතියේ දිනයන්හි
### Diploma in English (DE) – Week days

**පාඨමාලා කාලය :** මාස 06 කි. (සතියේ දින 2 ක දී)

**පාඨමාලා ගාස්තු** : රු 23,000 (වාරික 02 කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු 15,000)

**දේශන පැවැත්වීම -** මාර්ග ගත ක්‍රමය/ පැමිණ සහභාගීවීම

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි විෂය සඳහා “A” හෝ “B” සාමර්ථ්‍යයක් ලබා තිබීම හෝ ඉංග්‍රීසි සාහිත්‍ය විෂය සඳහා “C” සාමර්ථ්‍යයක් **හෝ** ඊට වැඩි සාමර්ථ්‍යයක් ලබා තිබීම **හෝ** අ.පො.ස. (උ.පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා “S” සාමාර්ථයක් ලබා තිබීම **හෝ** අප ඒකකය මඟින් පවත්වනු ලබන ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සමත් වී තිබීම.

(මෙම පාඨමාලාව සාර්ථක ව නිමකරන සිසුන්හට ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව හැදෑරීමට අවස්ථාව ඇත.)

## ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව
## Certificate Course in English (CCE)

**පාඨමාලා කාලය :** මාස 06 කි. (සති අන්ත - සෙනසුරාදා හෝ ඉරිදා)

**පාඨමාලා ගාස්තු :** රු. 12,000.00(වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 7,000.00)

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම හා අයදුම්පත් භාර ගන්නා දිනයට වයස අවුරුදු 16 සම්පූර්ණ වී තිබීම

*** පාඨමාලාවලට අදාළ දේශන හා විභාග පැවැත්වීම ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ බෙලිහුල්ඔය පරිශ්‍රයෙහි දී පමණක් පැවැත්වේ. අවශ්‍ය වුවහොත් පමණක් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ දේශන පැවැත් වේ.*

(මෙම පාඨමාලාව සර්ථක ව නිමකරන සිසුන්හට ඉංග්‍රීසි ඩිප්ලෝමාව හැදෑරීමට අවස්ථාව ඇත.)

## මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Software Engineering (DSE)

**පාඨමාලා කාලය :** වසර 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 36,000.00
(වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 20,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල/ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වීම සහ අ.පො.ස (උසස් පෙළ) තොරතුරු තාක්ෂණය විෂය සමත්වීම **හෝ** අ.පො.ස (උසස් පෙළ) සමත් වීම **හෝ** විශ්වවිද්‍යාලය මඟින් මෙහෙයවනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව සමත් වීම හෝ තොරතුරු තාක්ෂණ ක්ෂෙත්‍රයේ පිළිගත හැකි පාඨමාලාවක් හදාරා තිබීම.

## රත්නවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Gemmology (DG)

**පාඨමාලා කාලය :** වසර 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 80,000.00 (වාරික 03කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 40,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල/ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :** අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම ක්ෂෙත්‍රයකින් සමත් වීම හෝ ව්‍යවහාරික විද්‍යා පීඨ අධ්‍යයන මණ්ඩලයේ අනුමැතියට යටත්ව වෙනත් පිළිගත හැකි අධ්‍යාපන සුදුසුකම් සමඟ අදාළ ක්ෂෙත්‍රයක අවම වශයෙන් අවුරුදු 05 කට සමාන සහතික කළ සේවා පළපුරුද්දක් තිබිම.
දේශන විශ්වවිද්‍යාලයේ බෙලිහුල්ඔය පරිශ්‍රයේ දී හා පශ්චාද් උපාධි පීඨ අධ්‍යයන මධ්‍යස්ථානය - රත්නපුර දී පැවැත්වේ.

** අයදුම්කරුවන් ප්‍රමාණය ඉක්ම වුවහොත් යෝග්‍යතා පරීක්ෂණයක් සිදුකරනු ලැබේ.*

## පරිගණක හා තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
## Certificate in Computer and Information Technology (CIT)

**පාඨමාලා කාලය :** මාස 09 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 25,000.00
(වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 15,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල/ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්වීම **හෝ**
විශ්වවිද්‍යාලය මගින් අනුමත කරනු ලබන වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම.

## තොරතුරු තාක්‍ෂණය පිළිබඳ වෘත්තීය පාඨමාලාවන් (IT Professional Courses)

### පරිගණක ආශ්‍රිත උසස් සැලසුම් නිර්මාණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
### Certificate in Advanced Computer Aided Drawing (CAD)

### වෙබ් අඩවි පදනම් යෙදවුම් සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
### Certificate in Web Based Application Development (WEB)

### ජාවා උසස් වැඩසටහන්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
### Certificate in Advanced Java Programming (JAVA)

**පාඨමාලා කාලය :** මාස 06 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 16,500.00
(වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 10,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල/ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්වීම **හෝ**
විශ්වවිද්‍යාලය මගින් අනුමත කරනු ලබන වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම.

*** පාඨමාලාවලට අදාළ දේශන ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ බෙලිහුල්ඔය පරිශ්‍රයෙහි දී හා මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පැවැත් වේ.*

## ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Business Management (DBM)

**පාඨමාලා කාලය :** වසර 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 40,000.00
(වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 25,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් සමත් වීම (ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් විෂයන් 03ක්) **හෝ** අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත්ව පිළිගත් ව්‍යාපාර ආයතනයක අවම වශයෙන් වසර 03ක සේවා පළපුරුද්දක් තිබීම **හෝ** AAT, ACA, CIMA, CMA වැනි වෘත්තීය පාඨමාලාවක පළමු අදියර අවසන් කර තිබීම **හෝ** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඕනෑම විෂය ක්ෂේත්‍රයක ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම **හෝ** ඊට සමාන NVQ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

## සංචාරක හා සත්කාරක සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Tourism and Hospitality Management (DTHM)

**පාඨමාලා කාලය :** වසර 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 60,000.00(වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 35,000.00)

**පාඨමාලා මාධ්‍යය :** ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස (උසස් පෙළ) විභාගය ඉංග්‍රීසි විෂය සහිත ව සමත් වීම **හෝ** අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය ඉංග්‍රීසි විෂය සහිත ව සමත් වීම හා වසර 03 ක වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම **හෝ** රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකමෙහි 4 වන අදියරට (NVQ Level 4) සමාන පාඨමාලාවක් අවසන් කර තිබීම **හෝ** ජාතික වෘත්තීය සුදුසුකමෙහි 2 හෝ 3 වන අදියරට (NVQ Level 2 or 3) සමාන පාඨමාලාවක් අවසන් කර තිබීම හා වසර 05 ක වෘත්තීය පළපුරුද්දක් තිබීම.

## මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Financial Management (DFM)

**පාඨමාලා කාලය :** වසර 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 36,000.00(වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 20,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම ක්ෂේත්‍රයකින් සමත් වීම **හෝ** රජයේ හෝ පිළිගත් පෞද්ගලික අධ්‍යාපන ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකමෙහි 4 වන අදියරට (NVQ Level 4) සමාන පාඨමාලාවක් අවසන් කර තිබීම **හෝ** CA/ CIMA/ ACCA/ CIM/ HNDA වැනි පාඨමාලාවක් අර්ධ වශයෙන් අවසන් කර තිබීම **හෝ** AAT (ශ්‍රී ලංකා)/ AAT(එක්සත් රාජධානිය)/ ICSA(එක්සත් රාජධානිය)/ IBSL/ IFA(එක්සත් රාජධානිය) අවසන් කර තිබීම **හෝ** පිළිගත් මූල්‍ය ආයතනයක අවම වශයෙන් වසර 02 පළපුරුද්දක් තිබීම.

## පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Pre School-Teachers Training (DPSTT)

**පාඨමාලා කාලය :** අවුරුදු 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 40,000.00 (වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 25,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ.පො.ස. උසස් පෙළ සමත් වීම **හෝ** අ.පො.ස. සා/පෙළ (සිංහල භාෂාව සහ ගණිතය ඇතුළත්ව) විෂයන් 06 ක් සමත් වීම සමඟ රජයේ ලියාපදිංචි පෙරපාසලක/ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක සහායක වශයෙන් අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද **හෝ** අවමය වසර 12ක පාසල් අධ්‍යාපනයෙන් පසු SLQF මට්ටම 2 ට සමාන පදනම් පාඨමාලාවක් සමත් වීම සමඟ රජයේ ලියාපදිංචි පෙර පාසලක/ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක සහායක වශයෙන් අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද **හෝ** NVQ මට්ටම 4 පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සමඟ රජයේ ලියාපදිංචි පෙර පාසලක/ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක සහායක වශයෙන් අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද

**සහ**

**අනිවාර්ය සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම .**

මෙම එක් එක් පාඨමාලාවන්ට ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් **2023.02.13** වන දින සිට **2023.03.10** දක්වා පෙ.ව 8.30ත් ප.ව 4.00ත් අතර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ **විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය** වෙත පැමිණ රු.1,000.00 ක් ගෙවා (ආපසු නොගෙවන) ලබාගත හැකි ය. නැතහොත් **www.sab.ac.lk/codl** වෙබ් අඩවිය වෙත පිවිස අදාළ පාඨමාලාවේ අයදුම්පත හා බැංකු ගෙවීමේ රිසිට්පත බාගත කර ගත හැකි ය. තවද අයදුම්පත්‍ර ගාස්තුව වන රු. 1,000.00 ක මුදලක් (ආපසු නො ගෙවන) ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ ගිණුම් අංක **"0002246875"** ට අයදුම්කරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ පාඨමාලාවේ නම නිවැරදි ව දක්වමින් බැර කළ යුතු ය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත, බැංකු ගෙවීම් රිසිට්පත හා පහත සඳහන් ලේඛනයන්හි **සහතික කළ පිටපත්** සමඟ **අධ්‍යක්ෂ,විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ. පෙ.02, බෙලිහුල්ඔය** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය.

1. උප්පැන්න සහතිකය
2. සුදුසුකම් සනාථ කිරීමේ සහතිකය /ලිපියක් (අධ්‍යාපන හෝ වෙනත්)
3. ජාතික හැඳුනුම්පත

**එක් අයදුම්පතක් වලංගු වන්නේ එක් පාඨමාලාවකට අයදුම් කිරීම සඳහා පමණි. අසම්පූර්ණ හෝ වැරදි තොරතුරු අතුළත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි ය. ඉහත සඳහන් සියලු ම පාඨමාලාවලට අදාළ දේශන හා විභාග පැවැත්වීම ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ බෙලිහුල්ඔය පරිශ්‍රයෙහි දී සහ මාර්ගගත ක්‍රමයට (Online) පමණක් සිදු කෙරේ.**
**වැඩි විස්තර සඳහා විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ දුරකථන අංක 045-2280179 අමතන්න.**

***සැළකිය යුතුයි:**

**ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව හා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශේෂ කොන්දේසි**

මෙම ඉංග්‍රීසි පාඨමාලාවන් සඳහා අයදුම්පත් නිකුත් කිරීම හා බඳවා ගැනීම ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයෙහි දී පමණක් 2023.02.13 දින සිට 2023.03.10 දින දක්වා ලියාපදිංචි වීමේ ප්‍රමුඛතාව මත සිදු කෙරේ. තව ද සීමිත සිසුන් සංඛ්‍යාවක් බඳවා ගන්නා බැවින් නියමිත සිසුන් සංඛ්‍යාව සම්පූර්ණ වූ පසු ලියාපදිංචි කිරීම අවසන් විය හැකි ය. එබැවින් මෙම පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලි හා මුදල් රැගෙන **2023.02.13** වන දින සිට **2023.03.10** අතර කාලය තුළ **සතියේ දිනවල පමණක්** පෙ.ව 8.30 ත් ප.ව 3.00 ත් අතර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය වෙත පැමිණ ලියාපදිංචි විය යුතු ය.

**රැගෙන ආයුතු ලියකියවිලි (මුල් පිටපත හා ඡායා පිටපතක් අවශ්‍ය වේ)**

1. උප්පැන්න සහතිකය
2. හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාවට අදාළ ව සම්පූර්ණ කළ සුදුසුකම් සපුරා ඇති අධ්‍යාපන සහතික අනිවාර්යවේ. (ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අ.පො.ස. (සා.පෙළ) හෝ අ.පො.ස. (උ.පෙළ) හෝ ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවේ (CCE) සහතික රැගෙන ආ යුතුයි.)
3. ජාතික හැඳුනුම්පත
4. පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02 ක්
5. අයදුම්පත් ගාස්තුව රු.1,000.00
6. පාඨමාලා ගාස්තු (ඉහත සඳහන් පරිදි)

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
2023.02.12

වැඩි විස්තර : විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
දුරකථන අංක: 045-2280179